# පැසෙන්ජර්ලත් ගන්න වෙනවා !

ආනන්දයේ මගේ ශිෂ්‍යයකු හා පසුව හොඳ මිතුරකු වූ චන්ද්‍රා සුබසිංහ (සඳලංකාවේ වින්සන්ට් රාළහාමිගේ පුතා) ද මා තෝරා ගැනීමට රුකුලක් වී යයි සිතමි. නව ඇමතිවරයාගේ කිට්ටුම උපදේශකයා වූ චාර්ල්ස් අබයසේකර විසින් ම මගේ නිල නාමය තීරණය කරන ලදි. කාර්මික සම්බන්ධතා නිලධාරි, මුල් මාස තුන හතර තුළ මගේ සම්පූර්ණ කාලය වැය වූයේ දුක්ගන්නාරාළ නිලයටය. සංස්ථා දහසයක විවිධ දඬුවම්වලට භාජනය වූ සේවකයන්ගේ දුක්ගැනවිලිවලට සවන් දීම මුල් පියවර ය. සමහරෙක් දිග පෙත්සම් ලියා ගෙන ද පැමිණියහ. ඔවුන්ට විඳින්නට වූ අසාධාරණ අනන්ත ය. සේවයෙන් පහ කිරීමේ පටන් උසස්වීම් වේතනාධික නොදීම බඳු කුදු මහත් ප්‍රශ්න, කිසි ම සේවකයකු සාධාරණ හේතු උඩ දඬුවම් ලබා නැත. බහුතරයකට දඬුවම විඳින්නට සිදු වූයේ දේශපාලන හේතු නිසා ය. විරුද්ධ පක්ෂයට සහාය දීම නිසා ය. මෙම තේමා ගීතය හැම මැතිවරණයකින් අනතුරුව ම ගායනා කැරෙන්නක් බව වටහා ගන්නට මට ටික කලක් ගත විය.

රජයක් බලයෙන් පහ වූ විට නව රජයේ බලවතකුට ළං වීම මෙසේ පැමිණිලි ඉදිරිපත් කරන්නන් බොහෝ දෙනෙකුට පහසු කාරියක් විය. මේ බව හොඳහැටි අවබෝධ කරගන්නට මා සමත් වූයේ පසුව මහජන බැංකුවේ සේවයට ගිය විට ය. බරපතල මුදල් වංචාවක් නිසා සේවයෙන් පහ කරනු ලැබූ බැංකු නිලධාරියෙක් මා සිටියදී ම අභියාචනයක් ඉදිරිපත් කළේය. හේතුව දේශපාලනය ය. හැත්තෑ හතේ ආණ්ඩු පෙරළියෙන් පසු ඔහු රැකියාව ආපසු ලබා ගන්නට සමත් වූ බව මම පසුව දැන ගතිමි. අපට කීවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආධාර කිරීම නිසා සේවය නැතිවූ බවය. අමාත්‍යාංශයේ දී මා හමුවට ආ සමහරු මැති-ඇමතිවරුන්ගේ රෙකමදාරු ද රැගෙන පැමිණියහ. තවත් කෙනක් මන්ත්‍රීවරයකු කැටුවම එන්නට සමත් වූහ. දුක්බර හඬින් සිය අඳෝනාව ඉදිරිපත් කරන මේ අහිංසකයන් කෙරෙහි මුලදී මා තුළ හට ගත්තේ අව්‍යාජ අනුකම්පාවකි. පශ්චාත් මැතිවරණ-සමය සංස්ථා නිලධාරින්ට කාර්ය බහුල වූවකි. අමාත්‍යාංශයට ලැබෙන අභියාචන සියල්ලක් ම අදාළ සංස්ථාවට යැවෙන්නේ ඇත්ත තත්වය නිශ්චය කර ගනු පිණිස ය. පදනම් රහිත වුවද සියලු පැමිණිලි ගැන වාර්තා ඉදිරිපත් කිරීමට නිලධාරීහු උත්සුක වන්නෝ ය. ප්‍රමාදය නොහොත් අතපසු කිරීම නිලධාරියකු ගේ දේශපාලන පක්ෂපාතීත්වය ගැන සැක මතු කරන්නට ද සමත් විය හැකිය. සිදු වූ අසාධාරණය නිදොස් කරගනු වස් අප වෙත පැමිණි බොහෝ දෙනා දිව ගියේ මිරිඟුවක් පස්සේ බව අනාවරණය වන්නේ සංස්ථා වාර්තා ලැබුණු පසු ය.

අමාත්‍යාංශයෙන් එවනු ලබන පැමිණිලි-චෝදනා ගැන විස්තර වාර්තා ඉදිරිපත් කිරීමට සංස්ථා නිලධාරීන් තුළ ජනිත වන නව ශ්‍රද්ධාවට පාරිසරික හේතු ද බලපෑවේ ය. සංස්ථාවේ, විශේෂයෙන් උඩ මළුවේ-පරිසරය සසල වී ඇත. අරක් ගෙන සිටි අධිපතීන් එක්කෝ විමානයෙන් චුතව ගොසින් ය. නැතහොත් රත් වූ විමානය සිසිල් කර ගන්නට දුව පැන වෙහෙසෙමින් ය. සංස්ථා සභාපතිගේ ආයුෂ ආණ්ඩුවක ආයු කාලය ඉක්මවා යන්නේ කලාතුරකිනි. හුදෙක් දේශපාලන හේතු නිසා තනතුරු ලද්දන්ට දරුණු අපල ය. කාර්මික සංස්ථා අතුරින් පහක පමණ සදාහරිත සභාපතිවරු ද සිටියහ. ඔවුහු ආයතනයට පිරිමහින විශේෂ දැනුම හෝ පුහුණුව ලද්දෝ ය. ඉඳහිට කෙනෙක් දෙපක්ෂයට ම ඔරොත්තු දෙන විදියේ දේශපාලන රක්ෂණයක් ලබා සිටියහ. ඛනිජ වැලි සංස්ථාවේ සභාපති එල්.ජේ.ඩී. ප්‍රනාන්දු පළමු ගණයට ද, කඩදාසි සංස්ථාවේ සභාපති දෙවැනි ගණයට ද අයත් වූහයි සිතමි.

පළමු ගණයට අයත් විය යුතු පිඟන් සංස්ථාවේ ඩී.බී. පට්ටිආරච්චි භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර ද දැරුවේ ය. එහෙත් ඔහු ඉවත් කරන්නට විවිධ බලවේග ක්‍රියාත්මක විය. විශේෂඥයකු ලෙසින් විදේශ සේවයට යන්නට ඔහු යොමු වූයේ තනතුරින් පහ කිරීම යයි ද සිතමි. සභාපති පිටමං කිරීමේ ව්‍යාපාරය ගැන හරි හැටි නොදනිතත් නව සභාපති පත් කිරීමට වෙහෙස දැරූ කිහිප දෙනෙක් මා හොඳින් දන්නා පුද්ගලයෝ ය. ආනන්දයේ ආදි ශිෂ්‍යයකු වූ ආනන්ද මුණසිංහ නව රජය යටතේ ඒ වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් ව සිටියේ ය. සංස්ථාවේ පිරිස් කළමනාකරු වූ ආනන්ද ලැනරෝල් ආනන්දයේ මගේ ගෝලයෙකි. දෙන්නාම වරින් වර ඇමතිතුමාට ඇවිටිලි කරන්නට පැමිණියහ. ඇවිටිලි හැරෙන්නට ඉහළින් බලපෑම් කරන්නට සමතුන් ද සිටි බව මට පෙනී ගියේ පසුවය.

ඒ සිංහල තරුණ සංවිධානයේ රැස්වීමකදී ය. සාමාජිකයකු නොවුව ද, එවකට එහි ප්‍රබලයකු වූ වෛද්‍ය ශිෂ්‍ය බුද්ධදාස බෝධිනායකගේ ඇරයුමෙන් ඉඳහිට රැස්වීම්වලට යාමට මම පුරුදු ව සිටියෙමි. වාර්ෂික රැස්වීමේ දී එතෙක් මා එහි නොදුටු සාමාජිකයෙක් පරණ ලේකම් ලක්ෂ්මන් රණසිංහ පරදවා ලේකම් තනතුරට තේරුණේය. ඒ පිඟන් සංස්ථාවේ නව සභාපති ය. ආනන්ද ලැනරෝල් සාමාන්‍යාධිකාරි තනතුරට උසස් කරනු ලැබුවේ ප්‍රත්‍යුපකාර වශයෙනැයි ද සිතිමි. කළ හොඳ පස්සෙන් එලවන සැටියක් මා දුටුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල කාලය අවසන් වූ නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමට කාලය එළඹි විටය. අමාත්‍යාංශයේ සංස්ථා අංශයේ අධ්‍යක්ෂ චාර්ලිස් අබයසේකර වෙතට අවුත් ආනන්ද මුණසිංහ යළි පත් කිරීම අනවශ්‍ය යයි කීවේ නව සංස්ථා සභාපති ය. මා සිටියේ ඒ ළඟම ය. මම ඒ බව ආනන්දට කීවෙමි. සංස්ථාවේ නව සභාපතිගේ දුබලකම් තිබුණු බව සැබෑ ය. එහෙත් අවිවාදයෙන් පිළිගත යුතු කරුණ වූයේ ඔහුගේ පාලනය යටතේ සංස්ථාව පෙර නොවූ විරූ අයුරින් දියුණු වීමය. නිෂ්පාදනය වැඩි විය. නව නිෂ්පාදන සහ නව යන්ත්‍රාගාර බිහි විය.

දේශපාලන නොහොත් වෙනත් බලපෑම් මත සභාපති පත් කිරීම හේතු කොට දරුණු අන්දමින් ප්‍රපාතයට වැටුණේ පේෂකර්ම සංස්ථාව ය. ඇමතිතුමා විසින් ප්‍රථම වරට පත් කරන ලද සභාපති පිරිස් කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙක් ද විය. ඔහුගේ පත්වීම ඉහළින් කැරුණු නිර්දේශයක් අනුව ය. සංස්ථා ප්‍රධාන කාර්යාලයට ගිය පළමු දිනයේ ම ඔහු සිය විශේෂඥතාව ප්‍රදර්ශනය කළේ ය. දොරටුවෙන් ඇතුළු වන ඔහු දැක ආරක්ෂක භටයා (මුරකරු) නොනැගිට හිටිවනම සිටියේ ය. මේ යන තරබාරු මනුස්සයා කවුදැයි ඔහු නොදත්තේ ය. කාර්යාලයට පිවිසි නව සභාපතිගේ පළමු නියෝගය පිරිස් කළමනාකරුටය. අර අවිනීත සේවකයා පහ කරන්නට ය. පිරිස් කළමනාකරුගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා මුරකරුට යන්නට වූයේ ගේට්ටුවෙන් වෙනත් තැනකට පමණි. මට සිද්ධිය විස්තර කළේ පිරිස් කළමනාකරු හේරත් ගුණරත්නම ය. සභාපති වැඩි කලක් සිටියේ ද නැත.

සමස්ත සංස්ථා කාර්ය මණ්ඩලය ම (කිහිප දෙකනු හැර) එක්සත් ව සභාපති, සාමාන්‍යාධිකාරි ඇතුළු නිලධාරීන් පිරිසක් ම පිටුවහල් කිරීමේ අත්භූත සිද්ධිය ද සුබසිංහ ඇමතිතුමා වැඩ පටන් ගත් අවදියේ ම සිදු විය. මා අමාත්‍යාංශයට යන විටත් නොවිසඳී පැවැති මෙම අර්බුදය දිගට ඇදී යමින් පැවතිණ. පිටමං වූ නිලධාරීන් සහිත වෙනම ප්‍රධාන කාර්යාලයක් කොළඹ පිහිටවනු ලැබී ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වුණේ ද එම කාර්යාලයේ ය. මෙය වඩාත් පුදුම සහගත වූයේ තහංචියට ලක් වූ සභාපති අනෙකකු නොව, ඇමතිතුමාගේ පුරෝහිතයා වූ චාර්ල්ස් අබයසේකර වීම ය. විසඳුමක් ඉල්ලමින් වාගේ අමාත්‍යාංශයට ආ නිලධාරි පිරිසට මගේ ගෝලයො දෙතුන් දෙනෙක් ද අයත් වූහ. චාර්ල්ස් අබයසේකර යටතේ කෙළින් ම වැඩ කළ මම ගැලරියේ සිට මෙම පොරය නරඹන ප්‍රේක්ෂකයෙක් වූයෙමි. සාමාන්‍යාධිකාරි ඉවත් කළහොත් සභාපතිට දමා තිබූ තහංචිය ඉවත් කරන්නට සේවක පිරිස කැමති වූහ. සභාපති කෙරෙහි විරෝධයක් නොපෑ ඔවුහු සාමාන්‍යාධිකාරි නොරිස්සූහ. දූෂිත පාලනයක් නිසා නොව ඔහුගේ කළමනාකරණ ශෛලිය නිසා ය. තමාට හිතවත් ව සිටි සාමාන්‍යාධිකාරි කැප කරන්නට චාර්ල්ස් අබයසේකර අකැමැතිය. නව සභාපතිවරකු පත් කරන්නට ඇමතිතුමාට සිදුවිය. සංස්ථාව ඔරුවල වානේ සංස්ථාව ය.

රාජ්‍ය අංශයේ පළපුරුදු නිලධාරියෙක් සාමාන්‍යාධිකාරි වශයෙන් පත් කරනු ලැබී ය. එහෙත් පිරිස් කළමනාකරු හා ආරක්ෂක නිලධාරි තනතුරුවලට දේශපාලන සබඳතා මත පත් කරන ලද පුද්ගලයන් නිසා තරමක හෝ අවුල් ඇති විය. විශේෂයෙන් හැට දෙකේ කුමන්ත්‍රණ නඩුවේ විත්තිකාරයකු වූ සාජන්ට් හොඳමුනි ආරක්ෂක නිලධාරි තනතුරට පත් කිරීම හිතකර නොවීය.

සේවක දුක් ගැනවිලි ගලා ඒමට විරාමයක් ලැබීමත් සමඟ කාර්මික සම්බන්ධතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ අවසර මට ලැබුණි. සංස්ථා බොහොමයකම සමඟි පෙරමුණට අයත් පක්ෂ තුනට ම සම්බන්ධ වෘත්තීය සමිති ක්‍රියාත්මක විය. හැම එකක් ම තමන්ගේ ශක්තිය ප්‍රදර්ශනය කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටි බව ද පැහැදිලි ය. සිය සාමාජික සංඛ්‍යාව වර්ධනය කර ගැනීමට ඇමතිතුමාගේ ආශිර්වාදය පැතුවෝ ය. වේයන්ගෙ ාඩ පේෂකර්ම සංස්ථා වෘත්තිය සමිති නියෝජිත පිරිස අතර ඇමතිතුමා හඳුනන සේවකයෙක් ද සිටියේ ය. ඔහු කෙළින් ම ඉල්ලීමක් කළේ ය.